**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10 ශ්‍රේණිය**

**5.0 මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.**

**5.5 සුළු ගෙවීම් සටහන් කිරීමට සුළු මුදල් පොත පවත්වා ගනියි.**

**පැවරුම 4**

1. සුළු මුදල් අග්‍රිමය යනු කුමක්ද?
2. **සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය** යනුවෙන් කුමක් අදහස් වේද?
3. කවිදුගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය මාසිකව රු 2 500 කි.2020.01.01 දින සිට සුළු මුදල් අග්‍රිම ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.ජනවාරි මාසයේ ව්‍යාපාරයේ සිදු වූ සුළු වියදම්වල සාරාංශය පහත දැක් වේ.

| | |
|---|---|
| 01.01. | සුළු මුදල් අග්‍රිමය ලැබීම |
| 01.05 | ලිපිද්‍රව්‍ය රු 200 |
| 01.08 | ත්‍රීවීල් ගාස්තු රු 300 |
| 01.13 | තේ කොළ සඳහා රු90 |
| 01.16 | කාබන්කොල සහ පෑන් රු 60 |
| 01.17 | ප්‍රවාහන ගාස්තු රු 350 |
| 01.19 | සංග්‍රහ වියදම් සඳහා රු 225 |
| 01.22 | ප්ලාස්ටික් කොස්සක් ගත්තා රු 300 |
| 01.26 | අශාන්ට ගෙව්වා රු 500 |
| 01.27 | බිල්පොතක් මිලදී ගැනීම රු 120 |
| 01.30 | අග්‍රිමය ප්‍රතිපූර්ණය කලා |

අවශ්‍ය වන්නේ

1.සුළු මුදල් පොත පිළියෙල කරන්න

2.ලෙජර් ගිණුම් පිළියෙළ කරන්න

4. 2021.02.01 වන දින සුළු මුදල් භාරකරු අත ඉතිරිව තිබූ ශේෂය රු 260 කි.ජනවාරි මාසයේ සුළු වියදම්වල එකතුව රු 1540 කි.

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1.සුළු මුදල් අග්‍රිමය කීයද?

2.2021.02.29 වන දින ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරු වෙත ප්‍රතිපූර්ණය කරන මුදල කොපමණද?

3.2021.03.01 දින සුළු මුදල් අග්‍රිමය රු 200 න් වැඩි කිරීමට අදහස් කරන්නේ නම් ප්‍රතිපූර්ණය කරනු ලබන වටිනාකම කීයද?

5.සුළු මුදල් පොත හා සම්බන්ධ මූලාශ්‍ර ලියවිල්ලක් නම් කරන්න.